**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2022 නොවැම්බර් මස 04 වෙනි දින පැවැති අයවැය විශේෂ මහා සභා රැස්වීම.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ අයවැය විශේෂ මහා සභා රැස්වීම 2022 නොවැම්බර් මස 04 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 02. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා. |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.වී.ආරියරත්න මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.එස්.දීප්ති ධර්ම ශ්‍රී මැතිතුමා. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමා. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.එම්.හේමන්ත පෙරේරා මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.ඉන්දික මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමා. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමා. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.පියසේන මැතිතුමා. |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.චමින්ද ගුණරත්න මැතිතුමා. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ටී.රිද්මා අනුරුද්ධිකා ධර්මවර්ධන මැතිතුමිය |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සෙල්වනායගම් රගවන් මැතිතුමා. |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා. |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා. |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , රණවිරුවන් සිහිකිරීමෙන් පසුව ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු විපක්ෂනායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01. කල් දී ඇති යෝජනා.**

**01. <u>ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ යෝජනා.</u>**

01. 2023 වර්ෂයට අදාළ අයවැය කෙටුම්පත සභාවට ඉදිරිපත් කිරීමේ යෝජනාව.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

2023 වර්ෂයට අදාල අයවැය කෙටුම්පත සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ග් ඡන්දය විමසීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටින ලදී.

ඒ අනුව 2023 වර්ෂයේ වැඩසටහන් අයවැය වාර්තාව සඳහා සභාවේ එකඟතාවය මත ඡන්ද විමසීමක් සිදුකරන ලද අතර, එහි දී ගරු සභිකවරුන් පහත පරිදි ඡන්දය ප්‍රකාශ කරන ලදී.

**2023 වර්ෂයේ වැඩසටහන් අයවැය වාර්තාවට පක්ෂවූ ගරු සභිකයින් -**

| | | | |
|---|---|---|---|
| 1. | ගරු සභාපති | - | එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමා. |
| 2. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා. |

3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා.
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා.
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.වී.ආරියරත්න මැතිතුමා.
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය.
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එම්.එස්.දීප්ති ධර්ම ශ්‍රී මැතිතුමා.
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමා.
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ඒ.එම්.හේමන්ත පෙරේරා මැතිතුමා.
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඒ.ඉන්දික මැතිතුමා.
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය.
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය.
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා.
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා.
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමා.
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමා'
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා.
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය.

**2023 වර්ෂයේ වැඩසටහන් අයවැය වාර්තාවට විපක්ෂ වූ සභිකයින් -**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා.
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා.
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා.
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.පියසේන මැතිතුමා.
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ඒ.චමින්ද ගුණරත්න මැතිතුමා.
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ටී.රිද්මා අනුරුද්ධිකා ධර්මවර්ධන මැතිතුමිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සෙල්වනායගම් රගවන් මැතිතුමා.
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා

**2023 වර්ෂයේ වැඩසටහන් අයවැය වාර්තාවට ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැලකී සිටි ගරු සභිකයින්-**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා.

ඒ අනුව පක්ෂව ඡන්ද 18 කුත් , විපක්ෂව ඡන්ද 9 කුත් , නොපැමිණි අය 10ක් ලෙසත් , ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි අය 01කුත් ලෙස ඡන්දය ලැබුනි.

**<u>තීරණ අංක 01</u>**

2023 වර්ෂයට අදාළ අයවැය කෙටුම්පත සම්බන්ධව සභාවේ එකඟතාවය මත සිදු කළ ඡන්ද විමසීමේ දී වැඩි ඡන්ද 09 කින් 2023 වර්ෂයට අදාළ අයවැය කෙටුම්පත සභා සම්මත විය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ විශේෂයෙන් ම නිසි ආකාරයට අයවැය කෙටුම්පත ගරු මන්ත්‍රීවරුන්ට හා ගරු මන්ත්‍රීතුමියන්ලාට ලැබීමට කටයුතු කළ බවත් , පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් මෙම නෛතික ධූර කාලය තුළ නීත්‍යානුකූලව ඉදිරිපත් කිරීමට ඇති අවසන් අයවැය ලේඛනය බවත් , ඉදිරියේ දී රජයෙන් පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රාදේශීය සභා ධූර කාලය දීර්ඝ කිරීමක් නොකළහොත් 2023 වර්ෂයේ ධූර කාලය අවසන් වීමට නියමිත බවත් , එනමුත් ඉදිරි කටයුතු නියමාකාරව සිදු විය යුතු නිසා ලබන වර්ෂයේ පැමිණිය හැකි අභියෝග තේරුම් ගෙන අයවැය ලේඛනය සකස් කළ බවත් , උපකල්පන ඉවත් කර සත්‍ය ආදායම් හා සත්‍ය වියදම් අනුව මෙය සකස් කර ඇති බවත් ය.

ගරු සභාපතිතුමා විසින් 2023 අයවැය පණිවුඩය හා ප්‍රතිපත්ති ප්‍රකාශය සභාගත කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ මේ සියලු කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ප්‍රදේශයේ ගරුතර ස්වාමීන් වහන්සේලා , ගරු ආණ්ඩුකාරතුමා , පළාත් පාලන කොමසාරිස්තුමා ඇතුළු පළාත් සභාවේ සියලු නිලධාරීන් , ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලය , ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය නිරන්තරයෙන් ලබා දෙන සහයෝගය වෙනුවෙන් ස්තූතිවන්ත වන බව ය.තව ද ජාත්‍යන්තර දේශපාන හැල හැප්පීම් සමඟ අවු.5ක් හැකි උපරිමයෙන් ම ජනතාව වෙනුවෙන් කටයුතු කළ බවත් , මෙවැනි දේශපාලන හා ආර්ථික වශයෙන් අසීරු කාලයක් මීට පෙර කිසිදාක අත්විද

නොමැති බවත් , සභාවක් වශයෙන් පැමිණෙන සෑම ගැටළුවක් ම සභාව ඇතුලතදී ම සාකච්ඡා කර විසඳ ගත් බවත් , ලබන වර්ෂය අවසන් වීමට පෙර ඡන්දයක් පවත්වයි යන්න තමන් විශ්වාස කරන බවත් , නියමිත වෙලාවට මැතිවරණ පවත්වනවාට කිසිම අකමැත්තක් නොමැති බවත් , ජනතාව සුදුසු නායකයා පත් කරගනී යන්නත් , මෙම මහජන ආයතන ජනතාව වෙනුවෙන් පැවතිය යුතු බවත් , 2018 වර්ෂයේ සිටම ප්‍රාදේශීය සභා පනතෙහි සංශෝධන සිදු විය යුතු බවට අදහස් ඉදිරිපත් කළ බවත් , මෙපමණ ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධූර වැඩි කිරීම අවශ්‍ය නොවන බවත් , එය සභාවන් ට විශාල බරක් බවත් , යම් කිසි සුදුසු ක්‍රමවෙදයක් මේ සඳහා සකස් කළ යුතු බවත් පැවසූ ගරු සභාපතිතුමා 2023 අයවැය කෙටුම්පත සම්බන්ධව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙන ලදී.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා.</u>

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ සෑම දෙයකටම සෑම මොහොතකදී ම දේශපාලනඥයින්ට ඇඟිල්ල දිගු කරන බවත් , එවැනි අවස්ථා වල දී අසරණ තත්වයට පත් වන බවත් , පෙර සිටම ප්‍රාදේශීය සභාවට පැමිණ ජනතාව වෙනුවෙන් සේවය සැපයීමට කැමැත්තෙන් සිටි බවත් , ඒ අනුව සභාවට මන්ත්‍රීවරයෙක් ලෙස පැමිණ අද දින වනවිට 5 වන අයවැයටත් සම්බන්ධ වූ බවත් , කළ දේවල් සම්බන්ධයෙන් සභාපතිතුමාට ස්තූතිවන්ත වන බවත් , නමුත් සභාවෙන් තමන්ට කිසිම දෙයක් නොලැබුන බවත් , ඒ සම්බන්ධව කණගාටු වන බවත් , සුළු ව්‍යාපාරයක් සිදු කර ජීවිතය ගොඩනගන්නට වෙර දරන මිනිසුන්ට බදු ගසා ඒවායිනුත් මුදල් අය කිරීමට රජය උත්සාහ ගන්නා බවත් , ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධූරයට ගෞරවයක් අවශ්‍ය නිසා තමන් දැව ව්‍යාපාරයෙන් ද ඉවත් වූ බවත් , ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධූරයට ගෞරවය ඇති වන පරිදි කටයුතු කරන ලෙස සියලු ම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින බවත් , 2023 අයවැයට විරුද්ධ වීම පිළිබඳව සතුටු වන බවත් , මිනිසුන්ට හැකි උපරිමයෙන් ම සේවය ලබා දිය යුතු බවත් , කහවත්ත වැව්ලි සමාගමේ ඇති මුඩ් ඉඩම් අවුරුදු කිහිපයකට නැවත භාර දීමේ පොරොන්දුව මත දිළිඳු ජනතාවට බෙදා වෙන්කර මාංශ බෝග වවා කර ගැනීම සඳහා ලබා දීමට එහි අධ්‍යක්ෂක මණ්ඩලය කැමැත්ත පළ කළ බවත් , මේ සඳහා තමන් මැදිහත් වීමට කැමති බවත් , මොක ද වර්තමාන තත්වය මත කුසගින්නේ සිටින මිනිස්සු බොහොමයක් සිටින බවත් , නිර්මාණශීලී අදහස් ලබා ගෙන පැල්මඩුල්ල දියුණු කළ යුතු බවත් , නැවත ප්‍රාදේශීය සභාවට ඡන්දය ඉල්ලන්නේ නැති බවත් , ඊළඟ ඡන්දයේදී ගරු විපක්ෂනායකතුමා සභාපති ලෙස පත්වන බවට විශාල බලාපොරොත්තුවක් පවතින බවත් , ඒ සියලු දෙනාට පැල්මඩුල්ල දියුණු කිරීමට ශක්තිය ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරන බවත් , මේ ධූර කාලය තුළ කිසිවෙකුට හෝ හිත් රිදීමක් ඇති වූවා නම් සමාව ඉල්ලා සිටින බවත් ය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා.</u>

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ අප සභාවෙහි වියදම් පියව ගන්නටවත් ලැබෙන ආදායම ප්‍රමාණවත් නොමැති බවත් , ඒ තත්වයට රට පත්වූවේ වැරදි දේශපාලන ආර්ථික ප්‍රතිපත්ති නිසා බවත් , මෙහි කෝටි එකොළහ හමරක පමණ වියදමක් ඇති බවත් , පඩිනඩි ගෙවීමට මෙමඟින් භාගයක් පමණ ලැබෙයි යන්නත් , ගිය වර්ෂයේ වියදම් සමඟ මෙම වර්ෂය සලකා බැලූ විට කෝටි 02ක් පමණ පුනරාවර්තන වියදම වැඩි වී ඇති බවත් , මිනිසුන්ගෙ සුභ සාධන වැඩ සඳහා , සෞඛ්‍ය වැඩ සඳහා , ළඳරු පාසල් සඳහා , ක්‍රීඩා පිටි සඳහා , මාර්ග අලුත්වැඩියා කිරීම සඳහා ප්‍රමාණත් මුදලක් ඉතිරි නොවන බවත් , පුනරාවර්තන වියදම හා ආදායම ගලපුවාම ලක්ෂ 31ක් පමණ ඉතිරි වන බවත් , ඊට අමතරව රු.ලක්ෂ 62ක් වගේ පළාත් සභාවෙන් හෝ ලැබෙයි යන්නට බලාපොරොත්තු වන බවත් , එය ලැබුනොත් හොඳ බවත් , සභාවේ ආදායම වැඩි කර ගැනීමට ක්‍රමවේද සකස් කළ යුතු බවත් , අයවැයට ඒවාද හේතු වන බවත් , පරිසරයත් සමඟ ප්‍රාදේශීය සභාව තුලනතාවයකින් පවත්වා ගෙන ගිය යුතු බවත් , පරිසර කමිටුව පැවැත්විය යුතු බවත් , මොක ද පරිසරය පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතු බවත් , හදිසි ආපදා වෙනුවෙන් වෙන් කර ඇති මුදල් ප්‍රමාණවත් නොවන බවත් , සභාවේ වාහන වලට ලක්ෂ 62ක පමණ මුදලක් වෙන් කර ඇති බවත් , එය තැන් දෙකක දෙයාකාරයකින් සඳහන් වන බවත් , එම මුද්‍රණ දෝෂය නිවැරදි කළ යුතු බවත් , ඉන්ධන වෙනුවෙන් එපමණ මුදලක් වෙන් කර ඇති බවත් , වාහන නඩත්තු සඳහා තවත් විශාල මුදලක් වැය වන බවත් , අත්‍යවශ්‍ය වාහන හැර අනෙකුත් වාහන භාවිතය සීමා කළ යුතු බවත් , ඉහත කරුණු හේතුවෙන් අයවැයට විරුද්ධ වන බවත් , පවතින වාතාවරණය මත සෑම කාරණයකටම විශාල මුදල් වෙන් කළ නොහැකි බව වැටහෙන බවත් , අනාගතයේ දී අලුත් පාලකයන් සමඟ සැලසුම් සකස් කර කටයුතු කරමු යන්නත් ය.

වාහන භාවිතය හැකි උපරිමයෙන් ම අඩු කර ඇති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා.</u>

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ අයවැයෙහි සිදු විය යුතු සංශෝධනයන් පිළිබඳව මීට පෙර ද සාකච්ඡා කළ බවත් , ආර්ථිකය හා දේශපාලනය අස්තාවර තත්වයක පැවති බවත් , ඒවාට මිනිස්සු ප්‍රතිචාර දැක්වූ ආකාරය දුටු බවත් , පැවති තත්වය හමුවේ අයවැයක් ඉදිරිපත් කළ නොහැකි බව හදවතට එකඟව දන්නා බවත් , මෙවැනි අයවැයක් ගෙන ඒම පිළිබඳව සභාපතිතුමාට ස්තූතිවන්ත වන බවත් , නමුදු මෙහි වෙනස්කම් ඇති විය යුතු බවත් , එනිසා විරුද්ධ වූ බවත් , පහුගිය කාල වල රටක් වශයෙන් අපි ඉහළ ස්ථානයක සිටි බවත් , විවිධ හේතු මත පහළට වැටුනු බවත් , මේ වනවිට දියුණු රටක් ලෙස නම් කර ඇති බවත් , සියලු දෙනාම එකතු වී ඉදිරියට යා යුතු බවත් , තමාට ද ප්‍රාදේශීය සභාවෙන් කිසි දෙයක් ලැබී නැති බවත් , එනමුත් තමාගේ මුදල් වලින් වසමට සේවය කළ බවත් , එනිසා මෙපමණ දුරක් පැමිණීමට හැකි වූ බවත් , මේ රට විනාශ කිරීමට කිසිවෙකුට අදහසක් නොමැති බවත් , ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට තමන්ගේ නිවස ද නැති වූ මොහොතක ජනාධිපති ධූරය ලැබුනු බවත් , එනම් ඉවසීමෙන් වංචා නොකර සිටීමෙන් ලැබීමට දෙයක් ඇත්නම් අනිවාරයෙන් ම ලැබෙන බවත් , දේශපාලනය දැනගෙන අවබෝධ කර ගෙන ඉදිරියට යා යුතු බවත් , තමන්ගේ ප්‍රතිපත්තියෙහි ඉදිරියටත් සිටින බවත් , සියලු පක්ෂ වල අදහස් ගෙන ඉදිරි මාස තුනේ දී ජනතාවට සේවයක් කළ යුතු බවත් ය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා පවසා සිටියේ මෙම ධුර කාලයේ අවසන් අයවැය බවත් , අපහසු කාලයේ සභාවට ආදායමක් නොමැති අවස්ථාවක වුව ද අයවැයක් ඉදිරිපත් කර ඇති බවත් , මාර්ග හා සෞඛ්‍ය සේවා ප්‍රධාන වශයෙන් ප්‍රාදේශීය සභාවකින් ගමට සිදු විය යුතු බවත් , ජනතාවට කළ සේවය පිළිබඳව හා කළ දේශපාලනය පිළිබඳව තමන් තෘප්තිමත් නොවන බවත් , තවත් දේවල් කිරීමට තිබූ බවත් , දිළිඳු අයට වැසිකිළි ආධාර හා සෙවිලි ආධාර ලබා දීම පිළිබඳව අකමැත්තක් නොමැති බවත් , නමුදු ඒ තරම් වත්කමක් ප්‍රාදේශීය සභාවට නොමැති බවත් , තව ද ආධාර ලබා දුන් මිනිසුන්ට වඩා අපහසු මිනිස්සු ජීවත් වන බවත් , සභාවෙන් පොදු වැඩ තවත් වූවා නම් සතුටු වන බවත් , පක්ෂ විපක්ෂ භේදයකින් තොරව එක්ව ඉදිරියට වැඩ කරමු යන්නත් , අයවැයට සහභාගී වීමට ලැබීම පිළිබඳව සතුටු වන බවත්ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පෙ.ව.11.21 ට සභාවෙන් පිටවන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ අද ආවේගශීලිව කතා කළ යුතු දිනයක් වුව ද කිසිවෙක් එසේ කතා බහ නොකළ බවත් , ජනතාවට සේවය කිරීමට අවස්ථාවක් උදා වූ බවත් , ගරු සභාපතිතුමා නිසා දේශපාලනයට පියවර තබා එතුමාගේ ඉල්ලීම මත ඡන්දෙ ඉල්ලූ බවත් , මන්ත්‍රීධුරයක් හොබවන්නේ එතුමා නිසා බවත් , නැවත ඡන්දය ඉල්ලීමට බලාපොරොත්තු නොවන බවත් , නමුදු සභාපතිතුමා සමඟ ඉදිරියට ගමන් කරන බවත් ය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා.**

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා පවසා සිටියේ අයවැය ජයග්‍රහණය කිරීම පිළිබඳව සතුටු වන බවත් , පවුලෙන් දේශපාලනය කළ පිරිසක් නොවන බවත් , තමන් ද දේශපාලනයට පියවර තැබුවේ ගරු සභාපතිතුමා නිසා බවත් , එහි ගෞරවය ගරු සභාපතිතුමාට හිමි විය යුතු බවත් , ගරු සභාපතිතුමා සෑම අවස්ථාවකම පැල්මඩුල්ල ජනතාව සමඟ සිටිමින් සේවය කළ බවත් , වසමට වැඩ කිරීමට තමන්ට ද අවස්ථාව ලැබුනු බවත් , වර්ෂයක පමණ සිට තම වසමේ ද වීථි පහන් අක්‍රිය තත්වයේ පවතින බවත් , වර්තමානයෙහි රටෙහි පවතින තත්වය අවබෝධ කර ගෙන ජීවත් විය යුතු බවත් , අතීතයේ කසළ එක් රැස් කර ගැනීමටවත් නිශ්චිත ක්‍රමවේදයක් නොතිබුන බවත් , ඉන්ධන නොමැතිව පැවති මෙම අපහසු කාලයේ වුව ද ඉන්ධන ලබා දී නගරයෙහි පිරිසිදු කිරීම් කටයුතු මඟනොහැර කිරීමට ගරු සභාපතිතුමා කටයුතු කළ බවත් , ඒ සම්බන්ධව ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වන බවත් , ඉදිරි ධුර කාල වලදීත් ගරු සභාපතිතුමා සභාපති ලෙස තේරී පත් වන බවත් ය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙල්වනායගම් රගවන් මැතිතුමා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙල්වනායගම් රගවන් මැතිතුමා පවසා සිටියේ තමන්ට සභෑවෙන් බල්බ් එකක්වත් නොලැබී ඇති බවත් , තමන් වැඩකට සභාවෙහි ජේ.සී.බී.යන්ත්‍රය ලබා ගත් බවත් වැඩ කළ පැය 5ක කාලයට ඩීසල් ලීටර් 115ක් ගිය බවට තමන්ගෙන් විශාල මුදලක් ඉල්ල ගත් බවත් ඒ පිළිබඳව සොයා බලන ලෙසත් ය.

අනිවාරයෙන් ම ඒ පිළිබඳව සොයා බලන බවත් , පැයකට යන ඩීසල් ප්‍රමාණය ධාවන සටහන් පොතෙහි සඳහන් වන බවත් , එම අවස්ථාවේම ඒ පිළිබඳව සභාවට දැනුම් දුන්නනම් හොඳ බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ ආණ්ඩු බලයක් මුල් කාලයේ පැවති බවත් , එකල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් ලෙස ගමට විශාල සේවයක් කළ බවත් , මාර්ග සකස් කිරීමට හා රැකියා ලබා දීමට හැකි වූ බවත් ය.තව ද ආණ්ඩුවෙන් ලබා දෙන ආධාර මිනිසුන්ට ලබා දීම තීරණ කරන්නේ ඉස්සර ගමෙහි සිටි මන්ත්‍රීවරු බවත් , ඔවුන් රාජ්‍ය නිලධාරීන්ව ද මෙහෙය වන බවත් , සෑම වසමකම එම තත්වය දැකිය හැකි බවත් , එම තත්වය නැති කළ යුතු බවත් , නැතිනම් දිළිඳු අයට ආධාර නොලැබෙන බවත් එතුමා පවසන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය.**

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය පවසා සිටියේ තමන් ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා නිසා දේශපාලනයට පැමිණි බවත් , ගරු සභාපතිතුමා සමඟ සෑම මොහොතකදී ම එක්ව කටයුතු කළ බවත් , ඉදිරියටත් කටයුතු කරන බවත් ය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පියසේන මැතිතුමා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පියසේන මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ සියලු දෙනාම ගමේ සිට එක් අරමුණක් ඇතිව ගමට සේවය කිරීමට පැමිණි බවත් , තමන් මන්ත්‍රීවරයෙක් ලෙස සතුටු වන බවත් , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල ඩයස් මැතිතුමා සමඟ එක්ව තමන්ට ද විශාල වැඩ කොටසක් ගමට කිරීමට හැකි වූ බවත් , පිල් නොබෙදී එකට වැඩ කරමු යන්නත් , අනාගත ප්‍රාදේශීය සභාවකදී ගම රට දියුණු කිරීමට සියලු දෙනාට ශක්තිය ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරන බවත් ය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා.**

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා පවසා සිටියේ රට තුළ මෙවැනි අපහසු තත්වක් පවතිද්දීත් මෙවැනි අයවැයක් ඉදිරිපත් කිරීම පිළිබඳව ස්තුතිවන්ත වන බවත් , 2020 වර්ෂයේ සිටම රට තුළ පැවති වාතාවරණය මත බලාපොරොත්තු වූ පරිදි ජනතාවට සේවය කිරීමට අපොහොසත් වූ බවත් , යුද්ධය නැති කිරීමට හා කොවිඩ් වසංගතය නැති කිරීමට කටයුතු කළ නායකයන්ට ජනතාව සැලකූ ආකාරය නොසතුටුදායක බවත් , විපක්ෂයේ දේශපාලන පක්ෂ විසින් ජනතාව ඒවාට පොළඹවා ගත් බවත් , මෙම අරගල රට විනාශ කළ බවත් , පළාත් සභාවෙන් හා ආණ්ඩුවෙන් ලැබෙන ප්‍රතිලාභ නොලැබී යාම නිසා 2023 වර්ෂයේ දී විශාල සංවර්ධන කටයුතු කළ නොහැකි බවත් , වර්තමානයේ වීදි ලාම්පු බොහොමයක් අක්‍රිය වී ඇති බවත් , පවතින තත්වය අනුව ඒවා තේරුම් ගත යුතු බවත් , හැකි උපරිමයෙන් ම ගරු සභාපතිතුමා විසින් මන්ත්‍රීවරුන්ගේ සහය ඇතිව ජනතාවට සේවය කළ බවත් , මෙම අයවැය ලේඛනය සකස් කිරීමට ගරු ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලය දැක්වූ සහයට ස්තුතිවන්ත වන බවත් , 2023 වර්ෂය ජනතාවට හොඳ සේවයක් කිරීමට ආණ්ඩුවටත් සියලු දෙනාටමත් හැකි වේවායි ප්‍රාර්ථනා කරන බවත් , මෙම අවස්ථාවේ විදේශ ගතව සිටින ගරු උප සභාපති ඩී.වී.උපාලි මැතිතුමා අයවැය ලේඛනයට සහයෝගය දක්වන බව හා ඒ සම්බන්ධව ස්තුතිවන්ත වන බව ප්‍රකාශ කළ බවත් , ය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ අයවැය ලේඛනයෙහි 2021 සත්‍ය ආදායම් වල සමහර තීරු යටතේ කෙටි ඉරක් දක්වා ඇති බවත් , ඒවා ආදායම් ඇති ඒවා ද නැති ඒවා ද යන්න පැහැදිලි නැති බවත් , වියදම් විශ්ලේෂණයෙහි ප්‍රවාහන සම්බන්ධතා වල හැට හය ලක්ෂ විසිනවදහසක් දක්වා ඇති බවත් , සියලු වාහන වල ඉන්ධන ගාස්තු ඇතුලත් වන විට එම මුදල් ප්‍රමාණය ප්‍රමාණවත් ද යන්න ය.

ඊට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ඉන්ධන පරිහරණය කිරීම අඩු කර ඇති නිසා එම මුදල ප්‍රමාණවත් වන බව හා සෞඛ්‍ය කටයුතු සඳහා ප්‍රමුඛස්ථානය ලබා දී ඇති බව ය.

තව ද අධිකරණ කටයුතු වල පවතින නඩු සඳහා ද මුදල් වෙන් කළ යුතු බවත් , මෙම අවස්ථාවේ ඉතා කල්පනාකාරීව කටයුතු කළ යුතු බවත් , මාර්ගය දෙපස කැළෑ වැවී ඇති බවත් , වීදි පහන් අක්‍රිය වී ඇති බවත් , වීදි පහන් පිළිබඳව සංගණනයක් සිදු කර අංක කර භාරකාරයො පත්කර ඒවායෙහි නඩත්තුව සඳහා ක්‍රමයක් සකස් කළ යුතු බවට මීට පෙර කරුණු දක්වා ඇති බවත් , නව තාක්ෂණය භාවිතා කර මේවාට සුදුසු ක්‍රමවේදයක් සකස් කළ යුතු බවත් , පාතකඩ විද්‍යාල මාර්ගය පිරිසිදු කර දෙන ලෙස ඉල්ලා සිටිය ද එම කටයුත්ත සිදු නොවුන බවත් , මන්ත්‍රීවරු තිස් අට දෙනාට වැඩ පවරා ප්‍රයෝජනයක් නොගත් බවත් , පහුගිය කාලය පිළිබඳව සතුටු විය නොහැකි බවත් , අතීතයේ පැවති ඒකාධිපති පාලනයට වඩා පක්ෂ දේශපාලනය හොඳ බවත් , බිම් මට්ටමේ ඉන්න ජනතාවට අවස්ථාව ලබා දිය යුතු බවත් , අරගල වලට නායකයන් අවධානය යොමු කළ යුතු බවත් , ප්‍රජතන්ත්‍රවාදය රැක ගැනීමට සාමකාමී උද්ඝෝෂණ අවශ්‍ය බවත් , මිනිස්සු යාචක මානුෂිකත්වයක් ඉවත් කළ යුතු බවත් , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල දසනායක මැතිතුමා සඳහන් කළ පරිදි මිනිසුන්ට ඉඩම් දී වගා කටයුතු සඳහා අවස්ථාව ලබා දිය යුතු බවත් , මිනිස්සු ඇති හැකි අය බවට පත් කරන්නට පසුබිම සකසා දිය යුතු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා පෙ.ව.11.46 ට සභාවෙන් පිටවන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ 2023 අයවැය සම්න්ධව ස්තුතිවන්ත වන බවත් , ධූර කාලය තුළ පස් වන අයවැය බවත් , පැවති වාතාවරණය මත වර්ෂ දෙකක්ම ජනතාව බලාපොරොත්තු වූ සේවය ලබා දීමට නොහැකි වූ බවත් , මන්ත්‍රීවරයෙක් ලෙස පැල්මඩුල්ල ජනතාව විශ්වාසයෙන් ලබා දුන් මෙම කිරුළ වෙනුවෙන් වැඩ කරන බවත් , ප්‍රාදේශීය සභාවෙන් දෙයක් ලබා දෙනතුරු නොසිට ජනතාවට උදවු කළ යුතු බවත් , ජනතාවට සේවයක් කිරීම සම්බන්ධයෙන් තමන් සන්තෝෂ වන බවත් , මාධ්‍ය විසින් දේශපාලනඥයින් අවතක්සේරු කරන බවත් , ගිය වාර සභාවේදී අයවැය සම්බන්ධව සංශෝධන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දුන් බවත් , එම අවස්ථාවේ සංශෝධන ඉදිරිපත් කළා නම් ඒවා නිවැරදි කර ගැනීමට තිබූ බවත් , මෙම අවසාථාවේ සංශෝධන ඉදිරිපත් කිරීම සාධාරණ නොවන බවත් , සියලු දෙනා සමඟ ඉදිරියට ගමන් කරමු යන්නත් ය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය අදහස් දක්වමින් පවසා සිටියේ ගරු සභාපතිතුමා වීදි ලාම්පු ආදිය ලබා දී , වෙනත් පක්ෂයක් කියා වෙනසක් නොමැතිව උදවු කර ඇති බවත් ය.

**ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමා.**

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ අයවැයට සහය දැක්වූ සියලු දෙනාටම ස්තුතිය පුද කරන බවත් , පක්ෂ අනුව බෙදීම ඉතිහාසයේ සිටම ජනයාට පුරුදු කර ඇති දෙයක් බවත් , එනිසා මිනිසුන්ගේ මනස සකස් කළ යුතු බවත් , මැතිවරණයන් නියමිත දිනටම පැවැත්විය යුතු බවත් , එවිට මිනිසුන්ගේ මතය බැලිය හැකි බවත් , ඡන්දය සඳහා තමන් සූදානම් බවත් , තමන්ගේ නායකයන් සමඟ නියමාකාරව කටයුතු කර ජයග්‍රහණය කරන බවත් , කොරෝනා වසංගතය හේතුවෙන් ලංකාව ආර්ථික පසුබෑමකට ලක් වූ බවත් , නමුදු ප්‍රාදේශීය සභාවක් වශයෙන් හැකි උපරිම සහනය ජනතාවට

ලබා දෙමින් දෛනික සේවාවන් ඒ ආකාරයටම පවත්වා ගෙන ගිය බවත් , ජනතාවට කළ සේවාවන් කොපමණ දැයි කිව නොහැකි තරමටම සේවාවන් සිදු කර ඇති බවත් , තමන් ප්‍රාදේශීය සභාවට පැමිණෙන විට කසළ එක්රැස් කිරීම පිළිබඳව නිශ්චිත වැඩපිවෙළක් නොපැවතුන බවත් , ඒ සියලු දේ අද වන විට ක්‍රමවත් වැඩපිළිවෙලකට සිදු වන බවත් , පැල්මඩුලෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වැඩි දෙනෙක් සිටියද ප්‍රාදේශීය සභාවට කිසිවක් නොලැබෙන බවත් , හැකි උපරිමයෙන් ම ජනතාව වෙනුවෙන් සේවය කරන බවත් , තමන් මෙම තනතුරු වල නොමැති වුව ද ප්‍රාදේශීය සභාවක් ලෙස පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව ඉදිරියට යා යුතු බවත් , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්. සෝමරත්න මැතිතුමාගේ යෝජනාව අනුව පාතකඩ පන්සල පිරිසිදු කිරීමට කම්කරුවන් ලබා දිය නොහැකි වූයේ ස්ථිර කම්කරුවන් අඩු වීම හා කුළියට කම්කරුවන් බඳවා ගත නොහැකි වීම නිසා බවත් , පිංකම අවසන් වුවද එම මාර්ගය සුද්ධ කරන ලෙස තමන් ලේකම්තුමා ඇතුළු කම්කරුවන් දැනුවත් කළ බවත් ,  සෑම විහාරස්ථානයකම මේ දින වල කඨින පිංකම් පැවැත්වෙන බවත් , ඒ සියලු දෙනාම උපකාර ඉල්ලන බවත් , හැකි ආකාරයෙන් ඒ සියලු දේම සිදු කිරීමට බලාපොරොත්තු වන බවත් , විවේචන ඕනෑම කෙනෙකුට සිදු කළ හැකි බවත් , එනමුත් තමන්ගේ හෘද ශාක්ෂිය සත්‍ය දන්නා බවත් , පැවති වාතාවරණය මත විශාල වැඩ කොටසක් කරන්න අපහසු වුවද හැකි උපරිමය කිරීමට උත්සාහ කළ බවත් , පැල්මඩුල්ලෙ මිනිසුන්ට විදුලිය දීමට සෘජු මැදිහත්වීම් කිරීමට හැකි වූ බවත් , මාර්ග පද්ධතිය සකස් කළ බවත් , එනිසා මෙම ධූර කාලය සම්බන්ධව කණගාටු නොවන බවත් , ජනාතාවත් සමඟ සැමදා සිටින බවත්ය. 2022 නොවැම්බර් 30 වන දින සාහිත්‍ය උත්සවය රිල්හේන පන්සලේ පැවැත්වෙන බවත් , කාර්ය මණ්ඩලයේ විශාල පිරිසක් යොදවා මාර්ග සිතියම් ගත කිරීම සිදු කරන බවත් , අතුරු මාර්ග වල සිතියම් ගත කරන විට මන්ත්‍රීවරුන් සහය දෙන ලෙසත් , එහි දී මාර්ග නම් කිරීමට සභාවට යෝජනා කළ නම් ඇතුළත් කරන ලෙසත් ,  මාස 6ක් ඇතුලත එය අවසන් කළ යුතු බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

**02.** **වෙනත් කරුණු.**

- **නිවාඩු අනුමත කිරීම.**

අසනීප තත්ත්වය හේතුවෙන් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ඇති ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බිමල්ක ප්‍රමෝද්‍යා මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.වී.අජිත් නිශාන්ත මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සුරවීර මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ජී.අනෝමා ප්‍රියදර්ශනී ගාල්ලගේ මැතිතුමිය , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.පුෂ්පලතා වැලිකල මැතිතුමිය , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී කේ.ටී.මෝහන්දාස් මැතිතුමිය හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.ඉන්දික කුමාර දිසානායක මැතිතුමාහට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රීනී පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

- **සභාපතිතුමාගේ ස්තූති කතාව.**

අද දින සභාවට  පැමිණ  සිටින ගරු විපක්ෂ නායක තුමන් ඇතුළු  පක්ෂ  විපක්ෂ  ගරු මන්ත්‍රී  තුමන්ලාට හා  මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තුති කතාව අවසන් කරන ලදී.

**ප.ව.12.00 ට පමණ සභාවේ කටයුතු අවසන් විය.**

2022/11/28 වන දින<br>
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදීය.

ලේකම්<br>
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

ප්‍රාදේශීය සභා ................................................................ මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ...................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2022-12-08 වන දින<br>
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති<br>
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව